සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/1/MNF(A) | ඔබේ අංකය / உமது இல / Your No: ........ | දිනය / திகதி / Date: 2018.09.11 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම සමෘද්ධි කළමනාකරුවන්,

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වල ඵලදායීතාව ඉහළ නැංවීම.</u>**

දිවයිනපුරා ක්‍රියාත්මක සමෘද්ධි ප්‍රජාමූල බැංකු 1074 හා සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති 331 මගින් ගනුදෙනුකරුවන් සඳහා ලබාදෙනු ලබන සේවාව ඉහළ නැංවීම පිළිබඳව අපගේ විශේෂ අවධානය යොමුව ඇත.

02. එබැවින් මේ පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමුකර ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ මඟපෙන්වීමෙන් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාර්ෂිකව ඇගයීමකට ලක්කරනු ලබන ඵලදායීතාව පිළිබඳ පංචවිධ සංකල්ප වැඩසටහනට ඔබ බල ප්‍රදේශයේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති ඇතුලත් කරවීමට ප්‍රමුඛතාව ලබාදී කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. දැනටමත් ඵලදායීතා වැඩසටහනට ඇතුලත්ව කටයුතු කරනු ලබන සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කාර්යය මණ්ඩලයට මාගේ ප්‍රශංසාව පළ කරනු ලබන අතර, ඉදිරි ඇගයීම් වැඩසටහන්වලදී ඵලදායීතා වැඩසටහනට ඇතුලත් වූ බැංකු හා බැංකු සමිති සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලබන බවද දැනුම් දීමට කැමැත්තෙමි.

**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

04. දැනට එළදායිතා වැඩසටහන ක්‍රියාත්මක නොවන සමෘද්ධි බැංකු හා බැංකු සමිති වල පහත සඳහන් ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු බව ද දන්වමි.

4.1 අවශ්‍ය දෑ හා අනවශ්‍ය දෑ හඳුනාගැනීම හා අනවශ්‍ය දේ බැහැර කිරීම.

4.2 අවශ්‍ය දේ පහසුවෙන් පරිහරණය කළහැකි පරිදි පිළිවෙලකට සකස් කිරීම/ ඇහිරීම.

4.3 සමෘද්ධි බැංකු/ බැංකු සමිති ඉඩකඩ උපරිම ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි මේස, කබඩ් ඇතුළු උපකරණ ස්ථානගත කිරීම.

4.4 බැංකුව/ බැංකු සමිතිය අතුළත හා බාහිර පරිශ්‍රයන්හී සුපිරිසිදුකම අඛන්ඩව වැඩිදියුණු කිරීම.

4.5 ගණුදෙනුකරුවන් සඳහා අසුන්ගැනීමට ප්‍රමාණවත් ඉඩකඩ වෙන්කිරීම.

4.6 සමෘද්ධි බැංකුව මගින් ලබාදෙන සේවාවන් පිළිබඳව ගණුදෙනුකරුවන් දැනුවත් කිරීමේ අත්පත්‍රිකා, දැන්වීම් හා ප්‍රචාරක පුවරු ආදිය ස්ථානගත කිරීම හා ඒ සඳහා ඉඩකඩ වෙන්කර තැබීම.

4.7 ලිපිද්‍රව්‍ය ඇසිරීම සඳහා ගබඩා පහසුකම් ඇත්නම් නිසිපරිදි ගබඩා කර තැබීම. (අවශ්‍ය අවස්ථා වලදී කඩිනමින් ලබාගැනීමට හැකිවන පරිදි)

4.8 බැංකු/ බැංකු සමිති කාර්ය මණ්ඩලය හා ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම හා එය ක්‍රියාත්මක කිරීම පුරුද්දක් බවට පත් කිරීම.

05 මේ පිළිබඳ අවශ්‍ය වැඩිදුර උපදෙස් එළදායිතා ලේකම් කාර්යාලයෙන් හෝ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත එළදායිතා සංවර්ධන නිලධාරීන්ගේ සහයෙන් ලබාගැනීමට වැඩිදුරටත් කටයුතු කළ හැකි බවත් දන්වා සිටිමි.

මේ පිළිබඳව ඔබ දක්වන ප්‍රමුඛ අවධානය අගය කොට සළකමි.

ජේ.දඩල්ලගේ
අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත:- 01. අධ්‍යක්ෂ, එළදායිතා ලේකම් කාර්යාලය - සමෘද්ධි බැංකු වල එළදායිතා කටයුතු සාර්ථක කරගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එළදායිතා සංවර්ධන නිලධාරීන්ගේ සහාය ලබාදීමට කටයුතු කරන්නේ නම් මැනවි